ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No .
දිනය / திகதி / Date. 2024.09.12

පැමිණිලි පාර්ශවය : කේ. ඒ. රුවන් කුමාර මයා
නො. 32 ඩී, අඹගහතොට පාර,
මහ ගෝනදූව,
මොරොන්තුඩුව.

වගඋත්තර පාර්ශවය :

01. පො. සැ. 68770 එස්.පී.ඩී. ගැමුණු කුමාර මයා
කොට්ඨාස රථවාහන අංශය,
පොලිස් ස්ථානය,
පානදුර.

02. පො. සැ. 67870 පතිරණ මයා
කොට්ඨාස රථවාහන අංශය,
පොලිස් ස්ථානය,
පානදුර.

03. ස්ථානාධිපති
පොලිස් ස්ථානය,
මොරොන්තුඩුව.

පැමිණිලි අංකය : HRC/HO/2046/23

පැමිණිලි පාර්ශවයේ කරුණු දැක්වීම :

ඉහත නම් සඳහන් පැමිණිලිකරු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනුකරමින් ප්‍රකාශ පහත කරුණු ප්‍රකාශ කර ඇත. තමා 2023.04.25 වන දින රාත්‍රී 7.00 පමණ තමාගේ WP AAW 9417 දරන ත්‍රිරෝද රථයෙන් මොරොන්තුඩුව නගරයේ පිහිටි සතොස වෙළඳසැලට ගොස් නිවසට අවශ්‍ය බඩු ද රැගෙන නැවත නිවස බලා පැමිණෙමින් සිටියදී, මොරොන්තුඩුව පාලම අසලදී පානදුර කොට්ඨාස රථ වාහන අංශයේ නිලධාරීන් දෙදෙනෙක් විසින් තමාගේ ත්‍රිරෝද රථය නතර කරනු ලැබූ බවත්, ත්‍රිරෝද රථය නතර කළ පසු එම නිලධාරීන් විසින් තමාගෙන් රියදුරු බලපත්‍රය ඉල්ලා සිටි බවත් ප්‍රකාශ කර ඇත. එම අවස්ථාවේදී තමා ළඟට පැමිණි බැවින් රියදුරු බලපත්‍රය රැගෙන නොපැමිණි බවත්, නිවසට ගොස් එය රැගෙන පැමිණිය හැකි බවත්

තමා එම නිලධාරීන්ට ප්‍රකාශ කළ බව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී. එහිදී එම නිලධාරීන් දෙදෙනාගෙන් එක් නිලධාරියෙක් විසින් තමා බීමත්ව සිටින බව පවසා තමාට බැන වැදුනු බවත්, තමා බීමත්ව නොසිටි බැවින් එම චෝදනාව තමා විසින් ප්‍රතික්ෂේප කළ බවත් පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත. එහෙත් එම නිලධාරීන් දෙදෙනා විසින් තමාට පරුෂ වචනයෙන් බැන වදිමින්, තමා අත්අඩංගුවට ගෙන ත්‍රිරෝද රථයේ පසුපසට නගින ලෙස ප්‍රකාශ කළ බවත්, එක් නිලධාරියෙක් විසින් ත්‍රිරෝද රථය පදවාගෙන ද, අනෙක් නිලධාරියා මෝටර් සයිකලයෙන් ද මොරොන්තුඩුව පොලිස් ස්ථානය වෙත තමා රැගෙන පැමිණි බවත් ප්‍රකාශ කර ඇත. පොලිස් ස්ථානය වෙත පැමිණීමෙන් පසු තමාට අසභ්‍ය වචනයෙන් බැන වදිමින්, තමා බීමත්ව සිටී ද යන්න පරීක්ෂා කිරීම සඳහා බැලුන් බෝලය පුම්බන ලෙසට තමාට නියම කළ බව ප්‍රකාශ කර ඇත. තමා විසින් එම බැලුනය පිම්බූ බවත්, එම බැලූනයෙහි තාම බීමත්ව සිටින බවට තහවුරු නොවූ බවට පැමිණිලිකරු දුටු බව පැමිණිල්ලේ දක්වා ඇත. එහෙත් එම නිලධාරීන් ඒ පිළිබඳව සැලකිල්ලක් නොදක්වා තමා සිරමැදිරියට දැමූ බව ප්‍රකාශ කර ඇත. සිර මැදිරියට දැමීමට පෙර තමාගෙන් ප්‍රකාශයක් ලියවාගෙන, බලෙන් අත්සනක් ද ලබා ගත් බව පැමිණිකරු ප්‍රකාශ කර ඇත. පසුව රාත්‍රි 11.00 පමණ තමාට තාවකාලික අවසර පත්‍රයක් නිකුත් කර මොරොන්තුඩුව පොලිසිය විසින් පොලිස් ඇපයක් ලබාදී තමා මුදා හරිනු ලැබූ බව පැමිණිලිකරු සඳහන් කර ඇත.

2023.05.02 දින පානදුර මහෙස්ත්‍රාත් අධිකරණයේදී තමාගේ නඩුව විභාග කරන අවස්ථාවේදී තමා වෙනුවෙන් පෙනී සිටි නීතිඥ දිලූක එම්. සිල්වා මහතා විසින් ගරු අධිකරණය වෙත කරුණු දක්වමින්, තමා මත්පැන් පානය කර නොතිබූ බවත්, ව්‍යාජ චෝදනා ඉදිරිපත් කර තමාට නඩු පවරා ඇති බවත් අධිකරණයට ප්‍රකාශ කළ බව පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත. එම අවස්ථාවේදී මහේස්ත්‍රාත්තුමා විසින් අධිකරණයේදී බැලුනය නැවත පරීක්ෂා කළ බවත්, එම පරීක්ෂණයේදී තමා බීමත්ව සිට නොමැති බව අනාවරණය වූ බැවින් අධිකරණය විසින් තමා නිදොස් කොට නිදහස් කළ බවත් පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත. මෙම සිදුවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ගොනුකරමින් පැමිණිලිකරු ඉල්ලා ඇත්තේ, මෙම නිලධාරීන් විසින් තමාට අසභ්‍ය වචනයෙන් බැන වදිමින් අවමන් සහගත සැලකිල්ලට භාජනය කිරීම, පැය 06කට ආසන්න කාලයක් සිරමැදිරියට තමා රඳවා තබා ගෙන මානසිකව පීඩාවට පත් කිරීම, තමා නිර්දෝෂී බව ප්‍රකාශ කළ ද නොකළ වරදක් සිදුකළ බවට ප්‍රකාශයක් ලියා බලහත්කාරයෙන් අත්සන් ලබාගැනීම, බොරු චෝදනාවක් සඳහා අත්අඩංගුවට ගැනීම යන කරුණු හේතුවෙන් තමා පත්වූ මානසික පීඩාවන්ට හා මූල්‍ය පාඩු සඳහා සාධාරණයක් ඉටුකර දෙන ලෙසයි.

වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :

01. පො. සැ. 68770 එස්.පී.ඩී. ගැමුණු කුමාර මයා (කොට්ඨාස රථවාහන අංශය, පානදුර පොලිස් ස්ථානය)

ඉහත නම් සඳහන් පළමුවන වගඋත්තරකරු පැමිණිල්ල සම්බන්ධයෙන් 2024.04.05 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේදී පැවති පරීක්ෂණයට සහභාගී වෙමින් මෙසේ ප්‍රකාශ කර ඇත.

2023.04.25 වන දින පැය 19.50 ට මොරොන්තුඩුව බ්ලොක් ගල් වැඩවල අසලදී මොරොන්තුඩුව නගරයේ සිට පැමිණි ත්‍රීරෝද රථයක් පහන් නොදල්වා පැමිණි අතර, පො.සැ. 67870 නිලධාරියා විසින් විදුලි පන්දම දල්වා එම රථය නතර කරන ලදි. පසුව රියදුරු ළඟට ගොස් බලපත්‍රය ඉල්ලා සිටි අතර, බලපත්‍රය නොතිබූ බැවින්, රියදුරුගෙන් විස්තර විමසීමේදී කටින් මත්පැන් ගඳක් වහනය වූ බැවින් මත්පැන් පානය කර තිබේදැයි යන්න පරික්ෂා කිරීම සඳහා රථයේ රියදුරු මොරොන්තුඩුව පොලිස් ස්ථානයට රැගෙන යන ලදි. එහිදී 67870 පතිරණ නිලධාරියා විසින් රියදුරුට කට සේදීමට වතුර වීදුරුවක් ලබාදී, උප සේවා අංශයෙන් බීමත්කම පරික්ෂා කිරීමේ නලයක් ගෙන්වාගෙන රියදුරුට පෙන්වාදී, ඔහුට බැලුන් එක පුම්බන මෙන් ප්‍රකාශ කරන ලදි. නමුත් ඔහු ඊට මුලින් එකඟ නොවූ අතර, පසුව නැවත කියූ පසු ඔහු බැලූනය පුම්බා සිටින ලදි. පුම්බල ලද බැලූනයේ ඊතළය තිබෙන පැත්තට සවිකර බැලූන් එකේ වාතය නලය හරහා ගමන් කිරීමට සැලැසුවූ අතර, එවිට නලයේ කළුපාට මධ්‍ය රේඛාව ඉක්මවා කහ පාට කැට කොළ පාට විය. ඒ අනුව මෙම රථයේ රියදුරු බීමත්ව සිටින බව නිගමනය කරන ලද අතර, එය ඔහු වෙත දැනුම්දෙන ලදි. පසුව මෙම පැමිණිලිකරු ඔහුගේ මිතුරෙකුගේ දුරකථනයට ස්ථානාධිපතිතුමා අමතන බව පවසා, එම දුරකථනය 67870 පතිරණ නිලධාරියාට ලබාදෙන ලදි. එම නිලධාරියා දුරකථන ඇමතුමට කතා කර, ඒ කථා කළේ ඕඅයිසී මහත්තයා, මෙයා ක්වාටස් එක හදන්න බ්ලොක් ගල් දීලා තියනවා, මොකක් හරි කරන්න කියලා කිව්වා යනුවෙන් පැවසූ බව පො. සැ. 68770 එස්.පී.ඩී. ගැමුණු පවසන ලදි. පසුව අප විසින් මෙම තැනැත්තාගේ බීමත්කම පරික්ෂා කරන ලද නලය, බැලූන් එක, පොලිස් 414 පෝරමය සම්පූර්ණ කර රියදුරු ඉදිරියේ ලියුම් කවරයක දමා මුද්‍රා කර ඔහුගේ ඇඟිලි සලකුණු තබන ලද අතර, රියදුරු සහ රියදුරුගේ ත්‍රීරෝද රථය උපසේවක වෙත භාරදෙන ලදි. මෙම පුද්ගලයා බීමත්ව සිටි බවට ඔහු විසින්ම පිළිගන්නා ලද අතර ඔහුට කිසිදු බැණ වැදීමක් හෝ හිරිහැර සිදුකිරීමක් නොකළ අතර, රාජකාරිය පමණක් ඉටුකරන ලදි, යනුවෙන් ප්‍රකාශ කර ඇත.

**02. පො. සැ. 67870 පතිරණ මයා - (කොට්ඨාස රථවාහන අංශය, පානදුර පොලිස් ස්ථානය)**

දෙවන වගඋත්තරකරු වන ඉහත නම් සඳහන් නිලධාරියා, මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් 2024.04.05 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේදී පවත්වන ලද විභාගය සඳහා සහභාගී නොවූ අතර, ඒවන විට එම නිලධාරියා පිළිකා රෝගයෙන් පෙළෙන බවත් මහරගම පිළිකා රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටින බවත් එදින සහභාගී වූ පළමුවන වගඋත්තරකරු සහ එදින සහභාගී වූ මොරොන්තුඩුව පොලිස් ස්ථානයේ රථ වාහන අංශයේ ස්ථානාධිපති උ.පො.ප. ඩී.ජේ.එම්. හේමපාල මයා කොමිෂන් සභාව වෙත දන්වා සිටින ලදි. එබැවින් මෙම වගඋත්තරකරු පිළිකා රෝගය සඳහා ප්‍රතිකාර ලබමින් සිටින්නේද යන්න සහ පැමිණිල්ල සම්බන්ධයෙන් වැඩියමක් ප්‍රකාශ කිරීමට ඇද්ද යන්න සම්බන්ධයෙන් 2024.06.24 දිනැති ලිපිය මගින් එම නිලධාරියා වෙතින් විමසීමක් සිදුකරන ලදි. ඊට පිළිතුරු ලෙස වගඋත්තරකරු විසින් 2024.07.08 දිනැතිව වෛද්‍ය සහතිකයක් කොමිෂන් සභාව

වෙත තැපැත් මාර්ගයෙන් යොමුකර ඇති අතර පැමිණිල්ල සම්බන්ධයෙන් වැඩිමනක් කරුණු දැක්වීමක් සිදුකර නොමැත.

ඒ අනුව 02 වන වගඋත්තරකරුගේ ප්‍රකාශය ලෙස ස්ථානාධිපති මොරොන්තුඩුව පොලිස් ස්ථානය වෙතින් පැමිණිල්ල සම්බන්ධයෙන් කැඳවන ලද වාර්තාව උපුටා ගන්නා ලදි. 2024.04.17 දිනැතිව මොරොන්තුඩුව පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින් සහතික කර යොමුකරන ලද වාර්තාවෙහි, මොරොන්තුඩුව පොලිස් ස්ථානයේ රථවාහන සුලු වැරදි තොරතුරු සටහන් පොතෙහි 393 පිටුවෙහි 257 ඡේදය පරිදි පො.සැ. 67870 පතිරණ නිලධාරියාගේ අත්සනින් යොදන ලද සටහන පහත පරිදි උපුටා දක්වනු ලැබේ.

2023.04.25 සහ වේලාව පැය 20.20 යටතේ, "රථවාහන රාජකාරී සඳහා පිටව ගිය පො.සැ. 67870 පතිරණ වන මා ද පො.සැ. 68770 ගැමුණු නිලධාරියා ද සමඟ BAS 1506 දරණ යතුරු පැදිය සමඟ නගරයේ රථ වාහන රාජකාරී යෙදී සිටින අවස්ථාවේ මොරොන්තුඩුව සිට බණ්ඩාරගම දෙසට පැමිණි WP AAW 9417 දරණ ත්‍රීරෝද රථය අධික ශබ්දයක් කර පැමිණි අවස්ථාවේදී අප විසින් විදුලි පහන් දල්වා හස්ථ සංඥාව මඟින් ත්‍රීරෝද රථය නැවැත්තුවා. ඉන් පසු රියදුරු ලඟට ගොස් රියදුරු බලපත්‍රය, ආදායම් බලපත්‍රය, රක්ෂණ සහතිකය ඉල්ලා සිටින අවස්ථාවේදී ඔහු සමඟ කථා කිරීමේදී ඔහුගේ මුවින් මත්පැන් ගඳ වහනය වන බව අප දෙදෙනාට හැඟිගිය අතර, එම අවස්ථාවේදී ඔබතුමා මත්පැන් බීලාද රථය පදවන්නේදැයි ඇසූ විට, සර් මම බියර් එකක් බිව්වා යැයි පැවසුවා. ඉන් පසු රියදුරාට පැය 19.50 ට බීමත්ව රිය පැදවීමේ වරද පහදාදී අත්අඩංගුවට ගෙන මොරොන්තුඩුව පොලිස් ස්ථානයට ත්‍රීරෝද රථය සමඟ රැගෙන ආවා. රියදුරා වන කුරුප්පු ආරච්චිගේ රුවන් කුමාර, 111/ වමලිපුර, මොරොන්තුඩුව, 772330626 වී.බී. 1559456 WP AAW 9417 රියදුරාට කට සේදීමට වතුර වීදුරුවක් ලබාදී ශ්වසන පරීක්ෂණ නලය වන LIMIT : 0 80 G/vTIL:5/40.C-LOT:SRI 2022 MANU FACTURE: 121 2022 : GXPTAY දරණ ශ්වසන පරීක්ෂණ නලය රියදුරාට ලබාදී පිම්බීමට ලබාදුන් අතර, පුම්බන අවස්ථාවේදී එහි මැද ඇති කහ පාට කැට සීමාවෙන් එහාට කොළ පැහැයට ලක් විය. නලය මධ්‍යයෙන් කහ පාට කැට කොල පාට වීම නිසා බීමත්ව රියපැදවීමේ වරද පහදා දී පැය 19.55 ට අත්අඩංගුවට ගෙන ස්ථානයට ඉදිරිපත් කළ අතර ඔහුගේ රුධිරයෙන් මධ්‍යසාර ග්‍රෑම් 0.08 ක හෝ ඊට වැඩි නිසා බීමත්ව රිය පැදවීමේ වරදට ස්ථානයට ඉදිරිපත් කළ අතර, රියදුරාගේ බාහිරින් පෙනීමට කිසිදු තුවාලයක් හෝ කැළලක් නැති අතර, ශරීරයේ තුවාල කිසිවක් නොමැත. තවද නඩු කුච්තාංසි අංක බී.ආර්. 287/2023 පී.ආර්. 288/2023 යටතේ ශ්වසන පරීක්ෂණ නලය ඒ.ඒ.ඩබ්. 9417 දරණ ත්‍රීරෝද රථය සමඟ රියදුරා පො. කො. 100105 තාරක නිලධාරියාට භාර දුනිමි. තවද AA/36-239704 දරණ තාවකාලික රියදුරු බලපත්‍රය 2023.05.03 වන දින පානදුර මහෙස්ත්‍රාත් උසාවියට පැමිණෙන ලෙසට දැනුම් දුනිමි" යනුවෙන් සටහන් යොදා ඇත.

03. උ.පො.ප. ඩී.ඩේ.එම්. හේමපාල මයා (රථ වාහන අංශයේ ස්ථානාධිපති - මොරොන්තුඩුව පොලිස් ස්ථානය)

ඉහත වගඋත්තර පාර්ශවය 2024.04.05 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේදී පැවති පරීක්ෂණයට සහභාගී වෙමින් මෙසේ ප්‍රකාශ කර ඇත. 2023.04.25 දින පානදුර කොට්ඨාස රථ වාහන අංශයේ පො.සැ. 67870 පතිරණ, පො.සැ. 68770ගැමුණු යන නිලධාරීන් දෙදෙනා අංක WP AAW 9417 දරණ ත්‍රිරෝද රථය මත්පැන් පානය කර පැදවූ බවට කුරුප්පු ආරච්චිලාගේ රුවන් කුමාර, අංක 32/ඩී, අඹගහතොට පාර, මහගෝනදූව යන අය අත්අඩංගුවට ගෙන ඉදිරිපත් කර ඇත. මෙම අය මත්පැන් පානය කර සිටියද යන්න පරික්ෂාවක් සිදුකර එකී ශ්වසන පරීක්ෂණ කට්ටල නඩු බඩු දේපළ කුවිතාන්සි අංක 278/2023 යටතේ ද, WP AAW 9417 දරණ ත්‍රිරෝද රථය නඩු බඩු දේපළ කුවිතාන්සි අංක 288/2023 යටතේ ද, එදින පැය 20.20 ට පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත. සැකකරු වශයෙන් ත්‍රිරෝද රථයේ රියදුරු ද, නඩු බඩු ද එදින උපසේවයේ යෙදී සිටි පො.කො. 100105 තාරක නිලධාරියාට භාරදී ඇත. ඔහු විසින් පැය 20.40 ට මෙම සැකකරු හා නඩු භාණ්ඩ භාරගෙන ඇති අතර, පැය 21.40 ට මෙම අත්අඩංගුවට ගත් සැකකරුගේ ප්‍රකාශය පො.සැ. 68770 ගැමුණු නිලධාරියා විසින් සටහන් කර ඇත. පසුව 22.10 ට මෙම සැකකරුව 2023.05.02 දින පානදුර අධිකරණයේ පෙනී සිටීමට දක්වා ඇප මත මුදාහැර ඇත. 2023.05.02 දින පානදුර මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 5072 යටතේ ස්ථානාධිපතිතුමා විසින් මෙම බීමත් රියදුරු වන කුරුප්පු ආරච්චිලාගේ රුවන් කුමාර යන අයට විරුද්ධව මත්පැන් පානය කර රිය පැදවීමේ වරදට චෝදනා පත්‍රයක් ඉදිරිපත් කර ඇත. එකී නඩුවට එදින චූදිත ඉදිරිපත් වී ඇති අතර, ගරු මහෙස්ත්‍රාත්තුමා විසින් ඇල්කොලයිසර් නලය පරීක්ෂා කර එහි රේඛාව ඉක්මවා කොළ පාට වී නැති බවට සඳහන් කර අධිකරණයේ රාජකාරීවල යෙදී සිටි පො.සැ. 10107 ගුණසේකර නිලධාරියාට පෙන්වා එය පිළිගත් පසු චූදිතව අපරාධ නඩු විධාන සංග්‍රහයේ 186 වගන්තිය යටතේ නිදහස් කිරීමේ නියෝග නිකුත් කර ඇත, යනුවෙන් ප්‍රකාශ කර ඇත.

නිරීක්ෂණ :

01. පළමුවන වගඋත්තරකරු වන පො. සැ. 68770 එස්.පී.ඩී. ගැමුණු නිලධාරියා සහ දෙවන වගඋත්තරකරු වන පො.සැ. 67870 පතිරණ නිලධාරියා පානදුර කොට්ඨාශ රථවාහන අංශයේ සේවයේ නියුතු වේ. ඔවුන් පානදුර කොට්ඨාශයටම අදාළව රථ වාහන වැරදි සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනීම් සිදුකරන අතර, අත්අඩංගුවට ගැනීමෙන් පසු අදාළ පොලිස් ස්ථානය වෙත සැකකරුවන් භාරදීම සිදුකරනු ලබන බව පැමිණිල්ල විභාගයේදී කොමිෂන් සභාව වෙත ප්‍රකාශ කර ඇත. ඒ අනුව 01 සහ 02 යන වගඋත්තරකරුවන් විසින් 2023.04.25 වන දින මොරොන්තුඩුව නගරය ආසන්නයේදී පැමිණිලිකරු මත්පැන් පානය කර රිය ධාවනය කිරීමේ වරදට අත්අඩංගුවට ගෙන ඇති අතර, මොරොන්තුඩුව නගරය ආසන්නයේදී අත්අඩංගුවට ගත් බැවින් එම පොලිස් බල ප්‍රදේශයට අයත් මොරොන්තුඩුව පොලිස් ස්ථානය වෙත භාරදී ඇති බවට නිරීක්ෂණය වේ.

02. තවද පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම, කටඋත්තර ලබාගැනීම, බීමත් බව පරීක්ෂා කිරීම සඳහා ශ්වසන නල පරීක්ෂණය සිදු කිරීම, අදාළ බැලූනය පරීක්ෂා කිරීම, බැලූනයේ බීමත්ව සිටින බවට සලකුණු වන මට්ටම තහවුරු කර ගැනීම, අදාළ පරීක්ෂණ නලය මුද්‍රා තැබීම, සැකකරුගෙන් ඇඟිලි සලකුණු ලබාගැනීම යන රාජකාරී කටයුතු සියල්ලම 01 සහ 02 වගඋත්තරකරුවන් විසින්ම සිදුකර ඇති අතර මොරොන්තුඩුව පොලිස් ස්ථානයේ නිලධාරීන් එම කටයුතු සඳහා සහභාගීවී නොමැති බව නිරීක්ෂණය වේ.

03. පළමුවන වගඋත්තරකරු වන පො. සැ. 68770 එස්.පී.ඩී. ගැමුණු නිලධාරියා විසින් කොමිෂන් සභාවට ලබාදී ඇති ප්‍රකාශයෙහි සඳහන් කර ඇත්තේ, පැමිණිලිකරු සිය ත්‍රිරෝද රථයෙහි පහන් නොදල්වා පැමිණි බැවින් එම රථය නතර කළ බවයි. එහෙත් දෙවන වන වගඋත්තරකරු වන පො.සැ. 67870 පතිරණ නිලධාරියා මොරොන්තුඩුව පොලිස් ස්ථානයේ රථවාහන සුලු වැරදි තොරතුරු සටහන් පොතෙහි සටහන් යොදා ඇත්තේ, පැමිණිලිකරු ත්‍රිරෝද රථය අධික ශබ්දයක් කර පැමිණි බැවින් අදාළ රථය නතර කළ බවයි. මෙ අනුව පැමිණිලිකරු අත්අඩංගුවට ගත් නිලධාරීන් දෙදෙනා විසින් එකිනෙකට පරස්පර විරෝධී ප්‍රකාශ ලබාදී ඇති බව කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

04. එමෙන්ම පළමුවන වගඋත්තරකරු වන පො. සැ. 68770 එස්.පී.ඩී. ගැමුණු නිලධාරියා විසින් කොමිෂන් සභාවට ලබාදී ඇති ප්‍රකාශයෙහි, පැමිණිලිකරුගේ කටින් මත්පැන් ගඳක් වහනය වූ බැවින් මත්පැන් පානය කර තිබේදැයි යන්න පරීක්ෂා කිරීම සඳහා ඔහුව මොරොන්තුඩුව පොලිස් ස්ථානයට රැගෙන ගිය බව සඳහන් කර තිබුණ ද, ඔහු බියර් පානය කර සිටි බවට පිළිගත් බව ප්‍රකාශයෙහි දක්වා නොමැත. එහෙත් දෙවන වන වගඋත්තරකරු වන පො.සැ. 67870 පතිරණ නිලධාරියා මොරොන්තුඩුව පොලිස් ස්ථානයේ රථවාහන සුලු වැරදි තොරතුරු සටහන් පොතෙහි යොදා ඇති සටහනෙහි, "ඔහු සමඟ කථා කිරීමේදී ඔහුගේ මුවින් මත්පැන් ගඳ වහනය වන බව අප දෙදෙනාට හැඟිගිය අතර, එම අවස්ථාවේදී ඔබතුමා මත්පැන් බීලාද රථය පදවන්නේදැයි ඇසූ විට, සර් මම බියර් එකක් බිව්වා යැයි පැවසුවා" යනුවෙන් සටහන් කර ඇත. එකම ස්ථානයේ රාජකාරී කළ නිලධාරීන් දෙදෙනා වෙත පැමිණිලිකරු එවැනි ප්‍රකාශයක් සිදු කළේ නම් නොඇසී තිබීමට ඉඩප්‍රස්ථාවක් නොමැති බැවින්, වගඋත්තරකරුවන් විසින් ලබාදී ඇති ප්‍රකාශයන් එකිනෙකට පරස්පර විරෝධී බව කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

05. පළමුවන වගඋත්තරකරු වන පො. සැ. 68770 එස්.පී.ඩී. ගැමුණු නිලධාරියා විසින් කොමිෂන් සභාව වෙත ලබාදී ඇති ප්‍රකාශයෙහි, මෙම පැමිණිලිකරු පදවාගෙන පැමිණි ත්‍රිරෝද රථය නතර කළ අවස්ථාවේදී පැමිණිලිකරුගෙන් රියදුරු බලපත්‍රය තිබේද යන්න විමසූ බවත්; එම අවස්ථාවේදී පැමිණිලිකරු සතුව රියදුරු බලපත්‍රය නොතිබූ බවත් ප්‍රකාශ කර ඇත. එහෙත් දෙවන වගඋත්තරකරු වන පො.සැ. 67870 පතිරණ නිලධාරියා විසින් මොරොන්තුඩුව පොලිස් ස්ථානයේ රථවාහන සුලු වැරදි තොරතුරු සටහන් පොතෙහි යොදන ලද සටහන් අනුව, පැමිණිලිකරුගෙන් රියදුරු බලපත්‍ර ඉල්ලා සිටින අවස්ථාවේදී, පැමිණිලිකරුගේ මුවින් මත්පැන් ගඳක් වහනය වූ බව පමණක් සඳහන් කර ඇත.

එකම ස්ථානයේ රාජකාරී කළ නිලධාරීන් දෙදෙනාගෙන් එක් නිලධාරියෙක් පැමිණිලිකරු සතුව රියදුරු බලපත්‍රය නොතිබූ බවත්, එනෙක් නිලධාරියා ඒ පිළිබඳව සඳහන් නොකර තිබීමත් හේතුවෙන් ඔවුන් ලබාදී ඇති ප්‍රකාශ හා සටහන් තුළ පරස්පර විරෝධීතාවයක් පවතින බව කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

06. තවද, පො. සැ. 68770 එස්.පී.ඩී. ගැමුණු නිලධාරියා විසින් කොමිෂන් සභාවට ප්‍රකාශ කළ ආකාරයට රියදුරු බලපත්‍රය පැමිණිලිකරු සතුව නොතිබූ නමුත්, අධිකරණයට කරුණු දැක්වීමේදී පැමිණිලිකරු වෙත චෝදනා ගොනුකර ඇත්තේ බීමත්ව රිය පැදවීමේ වරදට පමණි. එය පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත ලබාදී ඇති නඩු අංක 5072/2023 දරණ නඩු වාර්තාවෙහි පිටපත පරීක්ෂා කිරීමේදී සනාථ වේ. පැමිණිලිකරුගේ ප්‍රකාශයෙහි ද තමා රියදුරු බලපත්‍රය රැගෙන නොගිය බව ප්‍රකාශ කර ඇති නමුත්, මෙම නිලධාරීන්ගේ පරස්පර විරෝධී ප්‍රකාශ හේතුවෙන් චෝදනා ගොනු කිරීමේදී බලපත්‍රයක් රහිතව රිය ධාවනය කිරීම රථ වාහන වරදක් වුවද, මෙම වගඋත්තරකරුවන් විසින් ඒ පිළිබඳව නොසලකා හැර ඇති බවට නිරීක්ෂණය වේ. පොලිස් රථ වාහන අංශයේ වගකිව යුතු නිලධාරීන් වශයෙන් මෙම වගඋත්තරකරුවන් නෛතික රාමුව තුළ නීතිය ක්‍රියාත්මක කිරීමේදී විධිමත් ආකාරයෙන් කටයුතු කර නොමැති බව කොමිෂන් සභාවට පෙනීයයි.

07. එමෙන්ම 01 වන වගඋත්තරකරුගේ ප්‍රකාශයේ සහ 02 වන වගඋත්තරකරු විසින් 2023.04.25 දින මොරොන්තුඩුව පොලිස් ස්ථානයේ රථවාහන සුලු වැරදි තොරතුරු පොතෙහි සටහන් කරන ලද ප්‍රකාශයෙහි පැමිණිලිකරු බියර් පානය කර සිටි බවට සඳහන් කර තිබුණ ද, පැමිණිලිකරු විසින් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද පැමිණිල්ල මගින්, මෙම වගඋත්තරකරුවන් බොරු චෝදනාවක් පැමිණිලි පොතේ සටහන් කර බලෙන් තමාගෙන් අත්සන් ලබාගත් බවට ප්‍රකාශ කර ඇති අතර, නඩු විභාගයේදී අධිකරණයට ද නීතිඥවරයෙකු මාර්ගයෙන් කරුණු දක්වමින් තමා බීමත්ව නොසිටි බව ප්‍රකාශ කර ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව 01 සහ 02 වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුගෙන් පොලිස් ස්ථානයේදී ලබාගන්නා ලද කටඋත්තරය ස්වේච්ඡාවෙන් ලබාගෙන නොමැති බවට පැමිණිලිකරු කරන ප්‍රකාශය වඩාත් පිළිගත හැකිය.

08. තවද, පැමිණිල්ල සනාථ කිරීම සඳහා පැමිණිලිකරු විසින් 2023.05.02 දින පානදුර මහේස්ත්‍රාත් අධිකරණයේදී පවත්වන ලද අංක 5072/2023 දරන නඩු තීන්දුවේ පිටපතක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. එකී නඩු වාර්තාව අනුව චූදිත වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥ දිලූක එම්. සිල්වා මහතා විසින් අධිකරණයෙන් කරන ලද ඉල්ලීම අනුව, ගරු මහෙස්ත්‍රාත්තුමා විසින් ඇල්කොලයිසරය පරීක්ෂා කර එහි රේඛාව ඉක්මවා කොළ පාට වී නැති බවට සඳහන් කර, අධිකරණයේ රාජකාරීවල යෙදී සිටි පො.සැ. 10107 ගුණසේකර නිලධාරියාට පෙන්වා එය පිළිගත් පසු චූදිතව අපරාධ නඩු විධාන සංග්‍රහයේ 186 වගන්තිය යටතේ නිදහස් කිරීමේ නියෝග නිකුත් කර ඇති බව නිරීක්ෂණය වේ. මේ පිළිබඳව 03 වන වගඋත්තරකරු විසින් කොමිෂන් සභාව වෙත ලබාදී ඇති ප්‍රකාශය තුළින් ද තහවුරු කර ඇත.

1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 186 වගන්තිය ප්‍රකාරව සැකකරුවෙකු නිදහස් කිරීමට මහේස්ත්‍රාත්වරයා සතු බලය පහත පරිදි වේ.

> *"මෙහි මින් පෙර ඇතුළත් කිසිවකින් නඩුවේ යම් කලින් අවස්ථාවක දී චූදිතයා නිදහස් කිරීමෙන් මහෙස්ත්‍රාත්වරයා වළක්වනු ලැබෙතැයි සලකනු නොලැබිය යුතු නමුත් එසේ නිදහස් කිරීමට හේතු මහෙස්ත්‍රාත්වරයා විසින් වාර්තාගත කරනු ලැබිය යුතු ය :*
>
> *එසේ වුවද නඩුව සම්බන්ධයෙන් වැඩිදුර නඩු කටයුතු පවත්වාගෙන යාමෙන් චූදිතයා වරදකරු කිරීමේ ප්‍රතිඵලය ඇති නොවන බවට තමා විසින් වාර්තා කරනු ලැබිය යුතු හේතු මත මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත් වන්නේ නම්, ඔහු විසින් චූදිතයා නිදොස් කරනු ලැබිය යුතුය."*

ඒ අනුව 01 සහ 02 වගඋත්තරකරුවන් විසින් මෙම පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට ප්‍රථම ඇල්කොලයිසරය නිවැරදිව පරික්ෂාවට ලක්කර නොමැති බවට හෝ හිතාමතාම අධිකරණය නොමඟ යැවීමට කටයුතු කර ඇති බවට නිරීක්ෂණය වේ.

නිගමනය :

උක්ත කරුණු සියල්ල සලකා බැලීමේදී 01 සහ 02 යන වගඋත්තරකරුවන් විසින් නීතියෙන් නියම කරනු ලැබූ කාර්යය පටිපාටියට අනුකූලව විධිමත් විමර්ශනයක් සිදුනොකර පැමිණිලිකරු බීමත්ව සිටි බවට චෝදනා ගොනුකරමින් නොසැලකිලිමත් ආකාරයෙන් අත්අඩංගුවට ගැනීමට කටයුතු කිරීම හේතුවෙන්, පැමිණිලිකාර පාර්ශවය සම්බන්ධයෙන්, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්තාවේ III වන පරිච්ඡේදයේ 13 (1) වන ව්‍යවස්ථාව මඟින් සහතික කොට ඇති "නීතියේ නියම කරනු ලැබූ කාර්යය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු සිරභාරයට ගැනීම නොකළ යුතුතේය" යන මූලික අයිතිවාසිකම පළමුවන වගඋත්තරකරු වන පො. සැ. 68770 එස්.පී.ඩී. ගැමුණු නිලධාරියා සහ දෙවන වන වගඋත්තරකරු වන පො.සැ. 67870 පතිරණ නිලධාරියා විසින් උල්ලංඝනය කර ඇති බවට කොමිෂන් සභාව විසින් මෙයින් නිගමනය කරනු ලැබේ.

එමෙන්ම පැමිණිලිකාර පාර්ශවය සම්බන්ධයෙන්, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12 (1) ව්‍යවස්ථාව මඟින් තහවුරු කර ඇති "නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය" යන මූලික අයිතිවාසිකම පළමුවන වගඋත්තරකරු වන පො. සැ. 68770 එස්.පී.ඩී. ගැමුණු නිලධාරියා සහ දෙවන වන වගඋත්තරකරු වන පො.සැ. 67870 පතිරණ නිලධාරියා විසින් උල්ලංඝනය කර ඇති බවට කොමිෂන් සභාව විසින් මෙයින් නිගමනය කරනු ලැබේ.

ඉහත නිගමන අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12 (1) ව්‍යවස්ථාව සහ 13 (1) ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන නිර්දේශ නිකුත් කරනු ලැබේ.

පොලිස්පතිවරයා විසින්,

1) 01 සහ 02 යන වගඋත්තරකරුවන් සම්බන්ධයෙන් සුදුසු විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතු අතර, අධීක්ෂණ වගකීම භාර මොරොන්තුඩුව පොලිස් ස්ථානයේ ස්ථානාධිපති සම්බන්ධයෙන් ද නිසි පරිදි තම රාජකාරී වගකීම ඉටු නොකිරීම පිළිබඳව විමර්ශනය කළ යුතුය. මේ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතුය.

2) 01 සහ 02 යන වගඋත්තරකරුවන් විසින් රු. 7500/- බැගින් රු. 15000/- ක මුදලක් පැමිණිලිකරු වෙත ගෙවිය යුතුය.

2024. ...10...16...... වන දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්ති ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශ ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශ ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකාර පාර්ශවය විසින් ද කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී. දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු)
සභාපති.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :- 01. අමාත්‍යතුමා,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

02. ලේකම්, - ඉහත නිර්දේශ
මහජන ආරක්ෂක අමාත්‍යාංශය, ප්‍රකාරව පියවර
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල. ගැනීමට.

03. පොලිස්පති, - ඉහත නිර්දේශ
පොලිස් මූලස්ථානය, කොළඹ 01. ප්‍රකාරව පි.ගැ.

04. සභාපති, - අ.ක.ස.
ජාතික පොලිස් කොමිෂන් සභාව,
අංක 09 ගොඩනැගිල්ල, BMICH පරිශ්‍රය,
බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

05. අධ්‍යක්ෂ, - අ.ක.ස.
මානව හිමිකම් කොට්ඨාශය,
එන්. එම්. පෙරේරා මාවත,
කොටා ටෙරසය, කොළඹ 08.

සැ.යු. - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මඟින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන්න.